# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/10 – 2013 අගෝස්තු 27 වැනි අඟහරුවාදා – 2013.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

19 වැනි වගන්තිය යටතේ ව්‍යාවස්ථාපිත නිශ්චය

විශේෂ අංකය: කො/3439.

කොළඹ 07, කේම්බ්‍රිජ් පෙදෙස, 9/7 හි පදිංචි ගර්ට් අයිරින් ගමගේ මහත්මිය විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යාවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යාවස්ථාපිත බඳු ගැනුම්කාරියට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඇයට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යාවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යාවස්ථාපිත බදු ගැනුම්කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි උපලේඛනයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2013 අගෝස්තු මස 15 වැනි දින,
අංක සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගම (අ.ග.පි. 528) යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද අංක GA/NGD/2010/16 දරන ප්‍රගමන අනුරේඛණයෙහි දැක්වෙන හෝමදොල මූකලාන නමැති ඉඩමෙහි කැබලි අක්ෂර සී දරන බිම් කොටසින් නොබෙදූ අක්කර: 50, රූඩ්: 0, පර්චස්: 00 ක ප්‍රමාණය ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

09 - 213

1A – G 18172 – 165 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*